# මුඛ පිළිකාවෙන් වැළකෙමු



**ජාතික පිළිකා මර්දන වැඩසටහන**

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

**555/5,ඇල්විටිගල මාවත**

**කොළඹ 05**

# මුඛ පිළිකා පිළිබඳව, ඔබ අවධානය යොමු කල යුත්තේ ඇයි;

## ➢ මුඛ පිළිකාව:

- පිරිමින් අතර බහුලතම පිළිකාවයි.
- කාන්තාවන්ගේ බහුලතම පිළිකා 10 අතර පවතී.

## ➢ සාමාන්‍යයෙන් දිනකට මුඛ පිළිකා ආශ්‍රිත:

- අලුත් රෝගීන් 06-07 ක් පමණ වාර්තා වේ.
- රෝගීන් 03 ක් පමණ මියයයි.

# මුඛ පිළිකා පිළිබඳව, ඔබ අවධානය යොමු කල යුත්තේ ඇයි;

ජාතික පිළිකා මර්දන වැඩසටහන

- මුඛ පිළිකා බහුතරයක් ඇතිවීමට පෙර මුඛ කුහරය තුළ පූර්ව-මුඛ පිළිකා තත්වයන් හටගනී.
- මෙම පූර්ව-මුඛ පිළිකා කලින් හඳුනාගෙන නිසි ප්‍රතිකාර ලබා ගතහොත් මුඛ පිළිකා ඇතිවීම වළක්වා ගත හැකිය.
- ස්ව-මුඛ පරීක්ෂාව මගින් ඔබගේ මුඛයේ ඇතිවන එවැනි අසාමාන්‍යතාවයන් ඔබටම හඳුනාගත හැකිය

**කලින් හඳුනාගෙන සංකූලතා වලකා ගමු**

# මුඛ පිළිකා සෑදීම සඳහා බලපාන අවදානම් සාධක

ජාතික පිළිකා මර්දන වැඩසටහන

## ප්‍රධාන සාධක

- බුලත්විට සැපීම
- දුම්කොළ/පුවක් අඩංගු නිෂ්පාදන (පුවක් පැකට්) සැපීම
- දුම්බීම
- මත් වතුර බීම

## අනෙකුත් සාධක

- ආසාදන (වෛරස හා දිලීර)
- පෝෂණ ඌනතා
- මුඛයේ අපිරිසිදුතාවය

මෙම පුරුදු එකක් හෝ කිහිපයක් ඇත්නම් ඔබත් අවදානම් කාණ්ඩයේ....

ජාතික පිළිකා මර්දන වැඩසටහන

# මුඛ පිළිකා සෑදීමේ ක්‍රියාවලිය (බහුතර අවස්ථා වලදී)

සාමාන්‍ය පුද්ගලයා → අවදානම් සාධක භාවිතය → පූර්ව මුඛ පිළිකා → නොනවත්වා අවදානම් සාධක භාවිතය → මුඛ පිළිකා

ජාතික පිළිකා මර්දන වැඩසටහන

# පූර්ව මුඛ පිළිකා ලක්ෂණ

- වේදනාවෙන් තොර පිහදා ඉවත් කල නොහැකි රතු, සුදු හෝ රතු - සුදු ලප
- මිරිස් සහිත ආහාර ගන්නා විට නිතර ඇතිවන මුඛයේ දැවිල්ලක්
- තොල් සහ මුඛ ශ්ලේෂ්මලයේ අසාමාන්‍ය සුදුමැලි ස්වභාවයක්
- ක්‍රමයෙන් ඇතිවන මුඛය විවෘත කිරීමේ අඩු බවක්

බොහෝ විට මෙම ලක්ෂණ වලින් එදිනෙදා ජීවිතයට අවහිරයක් නොවන බැවින් ඔබට මගහැරීමට ඉඩ ඇත.
**අවධානයෙන් පසුවන්න.**

# පූර්ව මුඛ පිළිකා අවස්ථා කිහිපයක්



සුදු ලප



රතු ලප



රතු - සුදු ලප



සුදු මැලි ස්වභාවය

ජාතික පිළිකා මර්දන වැඩසටහන

# පුවක් නිසා ඇතිවන මුඛ ශ්ලේෂ්මල ෆයිබ්‍රෝසියාව

- පුවක් ආශ්‍රිත නිෂ්පාදන නිසා ඇති වේ
- මුල් අවස්ථාවලදී: මිරිස් සහිත ආහාර අනුභව කිරීමේ නොහැකියාව
- මුඛ ශ්ලේෂ්මලය සුදුමැලි වේ
- මුඛ ශ්ලේෂ්මලය ආපසු හැරවිය නොහැකි පරිදි ක්‍රමක්‍රමයෙන් ඝනවේ





# පුවක් නිසා ඇතිවන මුඛ ශ්ලේෂ්මල ෆයිබ්‍රෝසියාව

ජාතික පිළිකා මර්දන වැඩසටහන

- අවසාන අවධිවලදී:
  - මුඛය විවෘත කිරීමේ ප්‍රමාණය අඩුවීම
  - කතා කිරීමේ අවහිරතා ඇතිවේ
  - ගිලීමේ අවහිරතා ඇති වීම




- ලංකාවේ නවතම දත්ත වලට අනුව වැඩිපුරම වාර්තාවන පූර්ව මුඛ පිළිකා අවස්ථාවකි
- මුඛ පිළිකා තත්වයකට පරිවර්තනය වීමේ වැඩි ප්‍රවනතාවයක් ඇත

ජාතික පිළිකා මර්දන වැඩසටහන

# මුඛ පිළිකා වල රෝග ලක්ෂණ

- පූර්ව මුඛ පිළිකා ලක්ෂණවල ඇතිවන හදිසි වර්ධනයක්
- මුඛය තුල සුව නොවන තුවාලයක්
- මුඛය තුළ කෙටි කාලයක් තුලදී ඇතිවූ අසාමාන්‍ය වර්ධනයක්
- කෙටි කාලයක් තුල ඇතිවූ ගිලීමට, සැපීමට හෝ දිව සෙලවීමට ඇති අපහසුව
- උගුරේ යමක් සිරවුවිට ඇතිවන හැඟීම (දිගටම පවතී)
- අසාමාන්‍ය දත් සෙලවීමක්





ජාතික පිළිකා මර්දන වැඩසටහන

# මුඛ පිළිකා වල රෝග ලක්ෂණ

- කෙටි කාලයක් තුල වෙනයම් හේතුවක් නිසා ඇති නොවූ උගුරේ ඉදිමීමක්
- දත ගැලවූ විට ඇතිවන තුවාලය සුව නොවී තිබීම
- මුඛය සහ දිවේ වේදනාව හෝ හිරිවැටුන ස්වභාවය
- කෙටි කාලයක් තුල ඇතිවූ කටහඬේ වෙනස් වීම
- දිගු කල් පවතින බෙල්ල ආශ්‍රිත වසා ගැටිති වල ඉදිමීම






ජාතික පිළිකා මර්දන වැඩසටහන

# ස්ව-මුඛ පරීක්ෂාව

## පරීක්ෂා කළ යුතු තැන්:

- උඩු සහ යටි තොල්
- කම්මුල ඇතුළත - වම සහ දකුණ
- උඩු තල්ල සහ උගුර
- දිව - සෑම පැත්තක්ම - මතුපිට, දෙපැත්ත, යට පැත්ත
- විදුරුමස - සෑම පැත්තක්ම
- මුඛයේ පතුල




A brief screen for *Oral Cancer* includes this 8 step examination of the inside of the mouth

ජාතික පිළිකා මර්දන වැඩසටහන

# ස්ව-මුඛ පරීක්ෂාව සිදු කරන ආකාරය

- දැත් හොඳින් සෝදා පිරිසිදු කරගන්න
- කෘත්‍රිම දත්-ඇඳි ආදී උපකරණ පළඳී නම් ඒවා ගලවන්න
- මුඛය හොඳින් සෝදා පිරිසිදු කරගන්න
- කන්නාඩියක් ඉදිරියට යන්න
- මුඛයට හොඳින් ආලෝකය වැටෙන්නට සලස්වන්න
- මුඛය විවෘත කර සෑම ස්ථානයක්ම පරීක්ෂා කරන්න

පරීක්ෂා කරන්න;;;;


ස්ථාන 5 පියවර 8




# 1. ස්ව-මුඛ පරීක්ෂාව - තොල් සහ ආසන්න විදුරැමස

ජාතික පිළිකා මර්දන වැඩසටහන

ඇඟිලි වලින් උඩු සහ යටි තොල් පිට පෙරළා තොල් ඇතුළත සහ ආසන්න විදුරැමස පරීක්ෂා කරන්න



# තොල් සහ විදුරුමස ආශ්‍රිතව මෙවැනි අසාමාන්‍යතාවයන් අත්දැයි බලන්න

- තොල්වල දක්නට ලැබෙන තුවාල



- තොල් සහ විදුරුමසේ පැහැය වෙනස් වීම
  - සුදු පැහැ ගැන්වීම



# 2. ස්ව-මුඛ පරීක්ෂාව - කම්මුල ඇතුළත - දෙපැත්තම සහ ආසන්න විදුරුමස

ජාතික පිළිකා මර්දන වැඩසටහන

මුඛය හොඳින් විවෘත කර කම්මුල ඇතුළත, මුඛයේ පැති බිත්ති සහ ආසන්න විදුරුමස පරීක්ෂා කරන්න






# කම්මුල ඇතුළත බහුලව දක්නට ලැබෙන අසාමාන්‍යතාවයන්;

කම්මුල ඇතුළත දක්නට ලැබෙන සුදු ලප




කම්මුල ඇතුළත දක්නට ලැබෙන සුදු සහ රතු මිශ්‍ර ලප



# 3. ස්ව-මුඛ පරීක්ෂාව: දිව - සෑම පැත්තක්ම

## දිව පිටතට ඇද, ඉදිරි කෙළවරේ සිට ඇතුළත දක්වා සෑම පැත්තක්ම (මතුපිට, දෙපැත්ත, යට පැත්ත) පරීක්ෂා කරන්න



පියවර 5


පියවර 6

# 4. ස්ව-මුඛ පරීක්ෂාව: මුඛයේ පතුල සහ ආසන්න විදුරුමස

ජාතික පිළිකා මර්දන වැඩසටහන

දිව උඩු අතට හරවා දිව යට හා මුඛයේ පතුල සහ ආසන්න විදුරුමස පරීක්ෂා කරන්න



# දිව සහ මුඛය පතුලේ බහුලව දක්නට ලැබෙන  අසාමාන්‍යතාවයන්



මුඛය පතුලේ දක්නට ලැබෙන වර්ධනයන්



දිවේ දක්නට ලැබෙන සුදු ලප



ජාතික පිළිකා මර්දන වැඩසටහන

# 5. ස්ව-මුඛ පරීක්ෂාව: උඩු තල්ල, ආසන්න විදුරුමස සහ උගුර ප්‍රදේශය

**හොඳින් මුඛය විවෘත කර උඩු තල්ල, ආසන්න විදුරුමස සහ උගුර ප්‍රදේශය පරීක්ෂා කරන්න**



# තල්ලෙහි සහ ආසන්න විදුරුමසේ බහුලව දක්නට ලැබෙන අසාමාන්‍යතාවයන්

ජාතික පිළිකා මර්දන වැඩසටහන

## තල්ලෙහි සහ විදුරුමසේ දක්නට ලැබෙන සුදු ලප



## තල්ලෙහි දක්නට ලැබෙන රතු ලප



ජාතික පිළිකා මර්දන වැඩසටහන

# අපි දැනුවත් වෙමු - අනුන් දැනුවත් කරමු

- දුම්කොළ සහ පුවක් ආශ්‍රිත නිෂ්පාදනවල අහිතකර ප්‍රතිඵල ගැන දැනුවත් වෙමු
- අවදානම් කණ්ඩායම් දැනුවත් කරන්න
- අවදානම් හැසිරීම්වලින් ඈත්ව සිටීමට තරුණ පරම්පරාව දැනුවත් කරන්න
- වක්‍ර ප්‍රචාරණ විධිවලට හසු නොවන්න
- බොරු සහතිකවලට හසු නොවන්න

# යහපත් මුඛ සෞඛ්‍යය පුරුදු පවත්වාගනිමු - මුඛ පිළිකාවෙන් වැළකෙමු;

ජාතික පිළිකා මර්දන වැඩසටහන

- බුලත්විට සැපීමෙන් වැළකෙමු
- දුම්කොළ/පුවක් අඩංගු නිෂ්පාදන (පුවක් පැකට්) සැපීමෙන් වැළකෙමු
- දුම්බීමෙන් වැළකෙමු
- මත් වතුර බීමෙන් වැළකෙමු






# යහපත් මුඛ සෞඛ්‍යය පුරුදු පවත්වා ගනිමු - මුඛ පිළිකාවෙන් වැළකෙමු

ජාතික පිළිකා මර්දන වැඩසටහන

- මාසයකට වරක් පුරුද්දක් ලෙස ස්ව-මුඛ පරීක්ෂාව සිදුකරන්න
- මුඛයේ වෙනසක් දුටුවිට හෝ සැකයක් ඇතිවූ විට වහාම දන්ත වෛද්‍ය උපදෙස් ලබා ගන්න
- වසරකට වරක්වත් සායනික මුඛ පරීක්ෂාවක් සිදුකර ගන්න
- මුඛයේ ඉහත සඳහන් වෙනස් වීමක් සිදුවී ඇත්නම් ප්‍රතිකාර කටයුතු සහ පසු විපරම් සායන වලට දැඩි ලෙස අනුගත වන්න
- යහපත් මුඛ සෞඛ්‍ය තත්ත්වයක් පවත්වා ගන්න



ජාතික පිළිකා මර්දන වැඩසටහන

# ඔබ දන්නවාද?

- දුම් රහිත දුම්කොළ නිෂ්පාදන සෑදීම, ආනයනය කිරීම, විකිණීම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම තහනම් බව
- සියළු සෞඛ්‍ය ආයතන තුල බුලත් විට, දුම්කොළ සහ පුවක් ආශ්‍රිත නිෂ්පාදන සැපීම සහ විකිණීම තහනම් බව
- සියළු රජයේ ආයතන තුල බුලත් විට, දුම්කොළ සහ පුවක් ආශ්‍රිත නිෂ්පාදන සැපීම සහ විකිණීම තහනම්ය බව
- දුම්රිය තුළ බුලත්විට සැපීම සහ කෙළගැසීමේ තහනම් බව
- පොදු මාර්ගවල කෙළ ගැසීම තහනම් බව

ජාතික පිළිකා මර්දන වැඩසටහන

# ඔබ දන්නවාද?



- දිනකට දුම් වැටි සහ බුලත් විට 5ක් භාවිතා කරන පුද්ගලයෙක් තම පුරුදු නවතා ගතහොත් රුපියල් 500කට ආසන්න මුදලක් ඉතුරු කරගත හැකිය
- මෙමගින් අවුරුද්දක් ඇතුලත රුපියල් 180,000 ඉතිරි කර ගත හැකිය

# සායනික මුඛ පරීක්ෂාව සිදු කරන ස්ථාන හා ප්‍රතිකාර

- දන්ත වෛද්‍ය සායන
- සුව දිවි මධ්‍යස්ථාන
- මෙම සායන වලට අමතරව දිස්ත්‍රික් මට්ටමේ ප්‍රාදේශීය දන්ත වෛද්‍යවරයගෙන්ද, බෝ නොවන රෝග වෛද්‍යවරයගෙන්ද මේ සඳහා උපදෙස් ලබා ගත හැකිය

## මෙම සායන වෙත පිවිසීමෙන් ලැබෙන ප්‍රතිකාර:


- මුඛ පිළිකා සහ පූර්ව මුඛ පිළිකා තත්වයක් තිබේදැයි සැක හැර දැනගැනීම
- අවදානම් පුරුදු පිළිබඳ දැනුවත් කිරීම, පුරුදු අඩු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම
- වැඩි දුර ප්‍රතිකාර සඳහා අවශ්‍ය සායන වෙත යොමු කිරීම

ජාතික පිළිකා මර්දන වැඩසටහන


# මුඛ පිළිකා ප්‍රතිකාර සහ ප්‍රතිකාර මධ්‍යස්ථාන

- මුඛ පිළිකා වලට ඇති ප්‍රධාන ප්‍රතිකාර:
  - ශල්‍යකර්ම
  - පිළිකා නාශක ඖෂධ ප්‍රතිකාර
  - විකිරණ ප්‍රතිකාර

- ශ්‍රී ලංකාවේ මුඛ පිළිකා ප්‍රතිකාර කටයුතු සිදු කරන මධ්‍යස්ථාන:
  - මුඛ හනුක වත්‍ර ශල්‍ය ඒකක 32ක්
  - පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථාන 22ක්




මුඛ හනුක වත්‍ර ශල්‍ය ඒකක




පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථාන

# යහපත් මුඛ සෞඛ්‍යය පුරුදු පවත්වාගනිමු - මුඛ පිළිකාවෙන් වැළකෙමු


ජාතික පිළිකා මර්දන වැඩසටහන
සෞඛ්‍ය අමාත්‍යාංශය
**555/5,**ඇල්විටිගල මාවත
කොළඹ 05

*+ 94 112368627* *nccpsl@yahoo.com* *https://www.nccp.health.gov.lk*

Njrpa Gw;WNeha; xopg;G epfo;r;rpj; jpl;lk;
Rfhjhu mikr;R
555/5, எல்விடிகலா மாவதா
கொழும்பு 05